**ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය -289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 17දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 17දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දෙපාර්තමේන්තුව සතු රු.3,000,000 ක ඉඩම් , එකතුව රු.7,728,000 ක ගොඩනැගිලි දෙකක් හා රු.720,000 ක වාහන 12 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව | වත්කම් ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ රු.3,380,950 ක් වැය කර අවස්ථා 09 කදී මිලදීගත් ප්‍රාග්ධන වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාළ ස්ථාවර වත්කම් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | වත්කම් ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අග්‍රිම ගිණුම (ඒසීඒ-03) අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂයක් නොතිබුණද භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත සටහන් (එස්ඒ - 70 ) අනුව රු.21,496,362 ක ශේෂයක් පැවතුණි. | **2023** දෙසැම්බර් **31** දිනට දෙපාර්තමේන්තුවේ ඉතිරිව තිබුණු අතර ජනවාරි මුල් සතිය තුල භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල අග්‍රිම ශේෂය බව | නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ දිස්ත්‍රික් කාර්යාලය සහ මාතලේ මධ්‍යම පැළ තවාන වෘක්ෂලතා ලේඛනයද, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය එළදා ලේඛනයද යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කරමින් පවතින බව | ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති , රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| **පාර්ලිමේන්තු පනත්**<br>1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනතේ 15 වගන්තිය | 289,964,900 | අමාත්‍යවරයා විසින් නියෝග සෑදීමෙන් පසුව කෘෂිකාර්මික භෝග වගාකරන සහ සකස් කරන තැනැත්තන්ට සහනාධාර සහ මූල්‍යමය හෝ වූ වෙනත් ආධාර ප්‍රධානය කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතු වුවද , අමාත්‍යවරයා විසින් නියෝග සෑදීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල අපනයන ප්‍රවර්ධන ආධාර ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තු වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම අනුමත වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයෙන් පසුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි | 2028 දක්වා සංයුක්ත සැලැස්මක් මේවන විට පිළියෙල කරමින් පවතින බව | සංයුක්ත සැලැස්ම නියමිත කාලය තුළ පිළියෙල කල යුතුය. |

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ භෝග වර්ග 12 ක් ප්‍රවර්ධනය කිරීමට රු.400,000,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර සමාලෝචිත වර්ෂය තුළ රු.387,697,746 ක් වැය කර තිබුණි. ඊට අදාලව වර්ෂය තුලදී බෝග වර්ග 12 කට අදාළ පැළ ගොවීන් වෙත බෙදා හැර තිබුණි. මේ අතුරින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පැළ 622,226 ක් ගොවීන් වෙත බෙදා දි තිබුණු අතර ඒ අතරින් මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ 03 ක නියැදි පරීක්ෂාවට භාජනය වූ ගොවීන් 10 දෙනෙකු වෙත ලබා දී තිබු ගම්මිරිස් පැල 9,580 ක් අතරින් පැළ 4,240 ක් විනාශ වී තිබුණි. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ රිකිල්ලගස්කඩ ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශයට අදාළව ගම්මිරිස් හා කෝපි පිළිවෙලින් 2,890 ක් හා 600 ක් ලබා දී තිබුණ ද ඉන් ගම්මිරිස් හා කෝපි පැළ පිළිවෙලින් 1,225 ක් හා 598 ක් විනාශ වී තිබුණි. | පසු විපරම් ප්‍රමාදයන් සිදුවීම අවම කිරීම සඳහා අධීක්ෂණ නිලධාරීන් සොයාබලා කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන් බව | බෙදා හරිනු ලබන පැළ මගින් උපරිම නිෂ්පාදනයක් ලබා ගන්නා තෙක් පසු විපරම් ක්‍රියාවලිය විධිමත් කළ යුතුය. |
| (ආ) | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පර්යේෂණ සඳහා සමාලෝචිත වර්ෂයේ රු10,000,000 ක ප්‍රතිපාදනය වෙන් කර ඉන් රු. 6,410,734 ක් වර්ෂය තුළ වැය කර තිබුණි. එයින් මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා රු. 5,703,092 ක ප්‍රතිපාදනයක් වෙන් කර සමාලෝචිත වර්ෂයේදී රු.3,607,811 ක් වැය කර තිබුණි. මාතලේ පර්යේෂණායතනයේ | සීනි රහිත කුරුඳු බිස්කට් නිෂ්පාදනය සම්බන්ධයෙන් විශේෂ පුහුණු වැඩසටහන් මගින් නිෂ්පාදකයින් දැනුවත් කිරීමට පියවර ගැනීම හා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ද මේ | පර්යේෂණ ප්‍රතිඵල ජාතික ආර්ථිකයට දායක කර ගැනීම හා ප්‍රායෝගික නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| කුරුඳු සම්බන්ධ සිදු කල පර්යේෂණයකට අනුව සීනි වෙනුවට කුරුඳු යොදා ගෙන බිස්කට් නිෂ්පාදනය කල හැකි බව නිගමනය කර තිබුණද ඒ සම්බන්ධව නිෂ්පාදකයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම රු.730,000 ක් වැය කර ගම්මිරිස් සම්බන්ධ පර්යේෂණ 04 ක් ක්‍රියාත්මක කර වියළි කළු ගම්මිරිස් සඳහා පයිපෙරීන් නිස්සාරණය කිරීම සඳහා ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාවේ වගා කරන ගම්මිරිස් ප්‍රදේශ අනුව එහි ගුණාත්මක බව වෙනස් වන ආකාරය විශ්ලේෂණය කිරීම සිදු කර තිබුණද ඒ සම්බන්ධව මහජනතාව මෙන්ම ගම්මිරිස් ගොවීන් වෙත සන්නිවේදනය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සඳහා සහයෝගය ලබා ගැනීමටද බිස්කට් නිෂ්පාදනය කරන සමාගම් වෙත මෙම තාක්ෂණය හඳුන්වා දීමට අපේක්ෂා කරණු ලබන බව ගම්මිරිස් සම්බන්ධව ඉදිරියේදි පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා මෙම පර්යේෂණ ප්‍රතිපල යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන බව අනෙකුත් නිෂ්පාදන සමබන්ධයෙන් කුඩා පරිමාණයෙන් නිෂ්පාදන සිදුකරන නිෂ්පාදකයින් සිටින අතර ඉදිරියේදීද ව්‍යවසායකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන බව | |

## 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මාතලේ පර්යේෂණ ආයතනයේ පැළ තවානෙහි පොලිතින් ගෘහයක් ඉදිකිරීම සඳහා 2021 දෙසැම්බර් 29 දින රු.420,031 ක් වැය කර අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අදාළ ඉදිකිරීම සිදු නොකර ද්‍රව්‍ය ගබඩා කර තිබුණි. | **2024** වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව දෙවන කාර්තුවට පෙර මෙම ඉදිකිරීම් සිදුකර අවසන් කිරීමට මේ වන විට සැලසුම් කර ඇති බව | නියමිත කාලය තුල අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව පරිහරණය කරන අක්කර 387 ක ඉඩම් කොටස් 31 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයිතිය පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව | ඉඩම් අයිතිය පවරා ගැනීමේ කටයුතු කල යුතුය. |
| (ආ) | තක්සේරු වටිනාකමෙහි එකතුව රු.4,850,000 ක වාහන 05 ක් වසර 2-4 ක් අතර කාලයක සිට නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව ප්‍රධාන කාර්යාලයේ හා මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ ගාල් කර තිබුණි. | වාහන අපහරණය කිරීමේ කමිටුවට ඉදිරිපත් කර ඇති බව | භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කල යුතු යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලබාගත් තොරතුරු වලට අනුව දෙපාර්තමේන්තුව මඟින් සෘජුවම ක්‍රියාත්මක වන පැළ තවාන් 12 ක නිෂ්පාදනය කළ හැකි උපරිම ධාරිතා මට්ටම පැළ 3,005,000 වූ අතර නිෂ්පාදන ඉලක්කය 2,104,508 ක් වී තිබුණද පැළ නිෂ්පාදනය 1,829,144 ක් විය. එම කාලය තුල සහතික කල පැළ 1,560,005 ක් වුවද ක්ෂේත්‍රයට නිකුත් කළ පැළ ප්‍රමාණය 1,514,813 ක් විය. දෙපාර්තමේන්තුව යටතේ පවතින කුණ්ඩසාලේ සහ නිල්ලඹ පැළ තවාන්වල උපරිම අපනයන බෝග පැළ නිෂ්පාදන ධාරිතාවය වාර්ෂිකව පැළ 250,000 ක් වුවද වාර්ෂික නිෂ්පාදනය පැළ 65,026 ක් එනම් සියයට 26 ක් තරම් අඩු මට්ටමක පැවතුණු අතර පැළ ඉලක්කයට සාපේක්ෂව ක්ෂේත්‍රයට පැළ නිකුත් කිරීම් සියයට 44 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. එසේම අනෙකුත් රජයේ පැළ තවාන් 10 උපරිම ධාරිතාවයට සාපේක්ෂව පැළ නිෂ්පාදනය සියයට 61 මට්ටමක පැවතුණි. | අදාළ කාලය තුළ පර්යේෂණ කටයුතු පවත්වා ගැනීමට ප්‍රමුඛතාව ලබා දෙන අතරතුර පැළ නිෂ්පාදනය ද හැකි උපරිමයෙන් සිදු කළ බව | පැළත තවාන් උපරිම ධාරිතාවයෙන් යුතුව ක්‍රියාත්මක කල යුතුය. |
| (ඇ) | මුල්හාල්කැලේ මධ්‍යම පැල තවානේ ඉඩම් අක්කර 4.2 ක් කිසිදු ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා නොගෙන ඌණ උපයෝජිතව පැවතුණි. | අක්කර **06** පර්චස් **40** ක ප්‍රමාණයෙන් යුත් තවාන් භූමියේ අක්කර **05** ක ප්‍රමාණයක් දැඩි බෑවුම් සහිතව පිහිටා ඇති බැවින් භූමි කළමනාකරණයේ දී භූවිෂමතාවයේ බාධාවක්ව පවතින බව | සම්පත් ඵලදායීව උපයෝජනය කල යුතුය. |

**3.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්හාල්කැලේ මධ්‍යම පැළ තවානේ රු. 470,745 ක ද්‍රව්‍ය ඌණතාවයක් පැවතියද ඒ සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන් හදුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට මු.රෙ.**104 (4)** පරීක්ෂණය කරමින් පවතින බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

**3.6 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිලියෙල කල මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු.903,544 ක පාඩු හා හානි 17 ක් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරීක්ෂණ කටයුතු සිදු කර පොතෙන් කපා හැරීමට හෝ වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ පරීක්ෂණ සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.7 කළමනාකරණ දූර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතුව වාහන 98 ක් තිබියදි 2022 මැයි මස සිට වසරක කාලයක් සඳහා මසකට කිලෝමීටර් 3,000 ක් ධාවනය කිරීමේ පදනම මත මාසිකව රු.178,000 ක කුලියකට වාහනයක් ලබා ගෙන තිබුණි. ඒ අනුව වර්ෂය තුල කිලෝමීටර් 36,000 ක් ධාවනය කළ යුතු වුවත් එම කාලය තුළ කිලෝමීටර් 18,020 ක් ධාවනය කිරීමෙන් කිලෝමීටර් 17,980 ක් ඌණ උපයෝජනය කර ඒ වෙනුවෙන් රු.1,066,813 ක පිරිවැයක් නිෂ්කාර්යයව ගෙවා තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් රාජකාරි ගමන් සීමා කිරීම, රජයේ ප්‍රතිපත්ති මත රාජ්‍ය වියදම් සීමා කිරීම , හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරිවල යෙදීම අඩු වීම, **QR** කේතය යටතේ ඉන්ධන ලබා දීම හා **ZOOM** තාක්ෂණය ඔස්සේ රැස්වීම් පැවැත්වීම යනාදී හේතු මත වාහන භාවිතය සීමා වූ බව | අවශ්‍යතාවය සලකා බලා වාහන කුලී පදනම මත ලබාගත යුතු අතර රජයට අවම පිරිවැයක් වන ලෙස කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී" ගිණුමේ විශ්‍රාම ගිය නිලධාරීන් 03 කගෙන් වසර 3 ත් 5 ත් අතර කාල පරාසයක සිට එකතුව රු.95,462 ක ණය ශේෂයක් හා සේවය හැර ගිය නිලධරීන් 06 ක්ගෙන් වසර 04 සිට 20 දක්වා කාලයක සිට පැවත එන රු.464,145 ක ණය ශේෂයක් අයකරගෙන නොතිබුණි | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විශ්‍රාම වැටුප් අංශය වෙත මෙම නිළධාරීන්ගේ විස්තර යොමු කර ඇති බව හා සේවය හැර ගිය නිලධාරින් 06 දෙනෙකුගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | අත්තිකාරම් අයකර ගැනීමට ක්‍රියමාර්ග ගත යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුව වාහන වලට අවශ්‍ය ටයර් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස එකතුව රු.2,416,265 ක ටයර් 50 ක් මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ඉන් රු.1,812,231 ක ටයර් 35 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි. | 2022 වර්ෂයේ වාහන නිසි පරිදි ධාවනය නොවීමත් නිසා එම වර්ෂයේ ටයර් නිකුත් නොවීමත්, 2023 වර්ෂය සඳහා තොග ශේෂ පවත්වාගෙන යාමේ අරමුණින් ටයර් මිලදී ගැනීම් සිදු කළ බව | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනිම් සිදු කල යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ පැළ තවාන් 02 ක වාර්ෂික ද්‍රව්‍ය අවශ්‍යතාවය නිශ්චිතව හඳුනානොගෙන මිලදී ගත් රු.2,294,000 ක වටිනාකමකින් යුත් බඳුන් මාධ්‍යය කියුබ් 102 ක් සමාලෝචිත වර්ෂය තුල භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | තොග මිලදි ගත් වර්ෂය තුළ නිෂ්කාර්යයව පැවතියද ඊළඟ වර්ෂය තුළ පැළ නිෂ්පාදන කටයුතු සඳහා භාවිතයට ගැනීමට අපේක්ෂා කරන බව | වාර්ෂික අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනිම් සිදු කල යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 166 ක පුරප්පාඩු පැවති අතර තනතුරු 24 ක් අතිරික්තව පැවතුණි. | අදහස් දක්වා නැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතු අතර අතිරික්ත තනතුරු සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 24 ක් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් තනතුරු වූ අතර එය දෙපාර්තමේන්තු කටයුතු සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපා තිබුණි | සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත 04 දෙනෙකු බඳවා ගත් බවත් 2023 ජූලි 29 වන දින විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇති විභාගයේ ප්‍රතිඵල මත ඉතිරි පුරප්පාඩු පිරවීමට නියමිත බව | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |
| **(ii)** | දිස්ත්‍රික් / විෂයානුබද්ධ ව්‍යාප්ති නිලධාරී තනතුරු **13** ක් හා ව්‍යාප්ති නිලධාරී තනතුරු **58** ක පුරප්පාඩු පැවතිම ක්ෂේත්‍ර කටයුතු මනා ලෙස පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | පුරප්පාඩු පිරවීමට අදාළව බඳවා ගැනීම් සිදු කිරීම සඳහාකළමනාරණ සේවාදෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |